# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

සමන් කාරියවසම්
"චාන්දනී"
ගොනාපිනුවල
<u>අභියාචක</u>

අභියාචනා අංකය : **806/2021**

එදිරිව

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
බිම් මහල
දක්ෂිණ පාය,
ලබුදූව
ගාල්ල
<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** :

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** :

අභියාචක නැත.

පොදු අධිකාරිය වෙනුවෙන් සුළු තාක්ෂණය ඔස්සේ පරිපාලන නිලධාරි ඩබ්.කේ.කේ චාමර මයා සහභාගී වේ.

**ලිඛිත සැළකිරීම්** :

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය** : 2022.04.20

**තීරණය කළ දිනය** : 2022.04.20

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.01.29 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*01. දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පාසැල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට අදාල ගුරු සේවා ව්‍යවස්ථාවේ නම, ඊට අදාල ගැසට් පත්‍රයේ අංකය හා දිනය.*

*02. ඉහත ආකාරයට දකුණු පළාත් සහා බල ප්‍රදේශයේ පාසැල් වලට බඳවා ගන්නා ගුරුවරුන්ගේ ස්ථාන මාරු කිරීම් වලට අදාල චක්‍ර ලේඛනයේ අංකය හා දිනය*

*03. දකුණු පළාත් සහා බල ප්‍රදේශයේ පාසැල් සංඛ්‍යාව සහ පාසැල් වර්ගීකරණයට අදාලව නිකුත් කර ඇති චක්‍ර ලේඛනයේ අංකය හා දිනය*

*04. ඉහත පාසැල් වර්ගීකරණයට අදාලව ගා / බටපොල මාධ්‍ය මහා විද්‍යාලය සහ ගා / සාරාලංකාර ම.වි. අයත් වන කාණ්ඩය*

*05. ගුරු මාරු චක්‍රලේඛනයට හා පාසැල් වර්ගීකරණය චක්‍ර ලේඛනයට අනුව එක් එක් කාණ්ඩයක අයත් පාසැලක ගුරුවරයෙකුට සේවය කල හැකි උපරිම කාලය*

*06. ගුරු මාරු චක්‍ර ලේඛනයේ කරුණු අභිබවා, යම් කාණ්ඩයකට අයත් පාසැලක උපරිම කාලයට වඩ සේවය කල ගුරුවරයෙකු එම කාණ්ඩයේම (එකම අධ්‍යාපන කලාපය තුල) පාසැලකට මාරු කල පසු ටික කලකින් සුහද මාරු වීම් ක්‍රමයක් යයි හැඳින්වෙන ගුරු මාරු ක්‍රමයක් මගින් යලිත් පෙර පාසැලටම ස්ථාන මාරු ලබා ගැනීමට අදාලව නීති/රීති/රෙගුලාසි / චක්‍රලේඛන තිබේ නම් එකී ලේඛන වල සහතික කල පිටපත් (තොරතුරු පනතේ 27(3) (ආ) වගන්තිය)*

*07. ඉහත ඡේදයේ සඳහන් ආකාරයට යම් කාණ්ඩයක පාසැලක උපරිම කාලය සේවය කල ගුරුවරයෙකු, මාරු කල පසු යලි සුහද මාරු ක්‍රමය යටතේ පෙර පාසැලට ස්ථාන මාරු සාදාගෙන පැමිණෙන්නේ නම් ඒ ගැන ගන්නා ක්‍රියා මාර්ගය*

තොරතුරු නිලධාරි විසින් 2021.02.17 වන දින මෙම තොරතුරු ඉල්ලීමට පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ප්‍රශ්න අංක 01*

*ව්‍යවස්ථාවේ නම-ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය*
*ගැසට් පත්‍රයේ අංකය හා දිනය-1885/38 හා 2014.10.23*

*ප්‍රශ්න අංක 02*

*ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය-අධ්‍යාපන අමාත්‍යංශ චක්‍ර ලේඛ අංක 2007/20 හා 2007.12.13*

*ප්‍රශ්න අංක 07*

*සුහද මාරු පදනම යටතේ සිදුවන ස්ථාන මාරු වීම් ඉල්ලුම්කරුවන්ගේ අභිමතය පරිදි සිදුවන අතර එම ස්ථාන මාරු සිදුවීමේ දී අදාල විෂය සඳහා පාසලේ පුරප්පාඩු ඇති වීමක් සිදු නොවේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි අදාළ ස්ථාන මාරු වීම් සිදුවන බැවින් එම ඉල්ලීම් ඉදිරිපත් වූ විට සුදුසු පරිදි ක්‍රියා කරනු ලබයි.*

*ප්‍රශ්න අංක 03, 04, 05, 06 සඳහා අදාළ තොරතුරු දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලෙස දන්වා සිටිමි.*

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.03.03 දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් සිදු කර ඇත.නම්කළ නිලධාරි නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2021.05.03 දිනැතිව කොමිෂන් සභාවට ඉහත අංක දරණ අභියාචනය යොමු ඇත.

**සළකා බැලීම**

ඉහත දින දරණ තොරතුරු ඉල්ලීමට අදාළ අංක 01,02 සහ 07ට අදාළ තොරතුරු දැනටමත් ලබා දී ඇත. අංක 03,04,05 සහ 06ට අදාළ තොරතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අභියාචක වෙත මුදා හැරීමට ක්‍රියා කළ හැකි බවට අද දින විමර්ශනයට පොදු අධිකාරිය වෙනුවෙන් සහභාගි වූ පරිපාලන නිලධාරි එම්.කේ.කේ චාමර මහතා සඳහන් කරන ලදී. ඒ අනුව 2022.05.15 වන දිනට ප්‍රථම තොරතුරු ඉල්ලීමෙහි අංක 03,04,05 සහ 06ට අදාළ තොරතුරු, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත ලබා දීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.